චක්‍රලේඛ අංක : 03/2018

සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක : 109, මහ වීදිය,
මත්තරමුල්ල.
2018. /04/23

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු, සණස සමිති,
සමුපකාර මණ්ඩල සහ සමුපකාර සමිති/ සංගම් සභාපතිවරුන් වෙත,

**අනුමත තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා**
**සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.) අනුමැතිය ලබා ගැනීම.**

2005-06-09 දිනැති බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ 10/2005 හි සඳහන් විධිවිධාන යාවත් කිරීම සහ ආයතනික කටයුතු පහසු කිරීම අරමුණු කර ගනිමින් එම චක්‍රලේඛය අවලංගු කිරීමටත්, ඒ සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන පැනවීමටත් කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

02. ඒ අනුව, බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් විසින් සමුපකාර සමිතියක් වෙනුවෙන් නිකුත් කරනු ලැබූ පිරිස් බල තක්සේරුව මඟින් යම් තනතුරක් අනුමත කිරීම, ඉන් ඉදිරියට නැවත පිරිස්බල තක්සේරුවක් අනුමත කරන තුරු දක්වා වන ඕනෑම කාලයක දී එම තනතුරෙහි ඇති වන පුරප්පාඩුවක් සම්පූර්ණ කිරීම සඳහා ලබා දුන් ප්‍රමාණවත් අනුමැතියක් වශයෙන් පිළිගනු ලබන බවත්, සමුපකාර සමිතියක තනතුරු පුරප්පාඩුවක් සම්පූර්ණ කිරීම සඳහා සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමාගේ විශේෂ අනුමැතිය හෝ වර්ෂ 03ක් ඇතුළත අනුමත කරන ලද පිරිස්බල තක්සේරුව අවශ්‍ය නොවන බවත් කොමිෂන් සභා නියමය පරිදි කාරුණිකව දන්වා සිටිමි.

03. එසේම, දැනට ක්‍රියාත්මක වන බඳවාගැනීමේ ක්‍රියාවලියට අදාල අනෙකුත් විධිවිධාන එලෙසින්ම ක්‍රියාත්මක වන අතර, අනුමත තනතුරක ඇතිවන පුරප්පාඩුවක් සම්පූර්ණ කිරීමේ දී එම විධිමත් ක්‍රියා පරිපාටිය අනුගමනය කළ යුතු වන බව ද කොමිෂන් සභා නියමය පරිදි වැඩිදුරටත් දන්වා සිටිමි.

එස්. ඒ. එල්. රංගනී,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් :

1. ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත.
2. ලේකම්, සමුපකාර සංවර්ධන හා වෙළඳ අමාත්‍යාංශය - බස්නාහිර පළාත.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් - බස්නාහිර පළාත.
4. අධ්‍යක්ෂ, සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - බස්නාහිර පළාත.
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ/ගම්පහ/කළුතර)
6. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව.
7. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්.
8. සියළුම සමුපකාර සේවක වෘත්තීය සමිති .